ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආපදා කළමනාකරණ අංශය
அனர்த்த முகாமைத்துவ பிhpவு
DISASTER MANAGEMENT SECTION

ලේකම්
செயலாளர்
Secretary

දු.අ. தொ.எ 0112381154 T.N.
වි.තැ. மி.அ. மு secdefence@defence.lk Email

ආපදා කළමනාකරණ අංශය
அனர்த்த முகாமைத்துவ பிhpவு
Disaster Management Section

දු.අ. தொ.எ 0112665170 T.N.
ෆැක්ස් பெக்ஸ் 0112665170 Fax
වි.තැ. மி.அ.மு secretarymdm2015@gmail.com Email

විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை Vidya Mawatha, Colombo 07, Sri

මගේ අංකය / எனது இல / My No. NDRSC/1/2/1

දිනය / திகதி / Date 2020.05. 15

ආපදා කළමනාකරණ මාර්ගෝපදේශ අංක 01/2020

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,**

<u>හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත් ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථාන වලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම සඳහා වන මාර්ගෝපදේශය</u>

හදිසි ආපදා තත්ත්වයකදී විපතට පත් වන ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානවලින් ඉවත් කරන ජනතාවට සහන සැලසීම හා හානියට පත් ප්‍රදේශ යථා තත්ත්වයට පත්කිරීම සඳහා වන උපදෙස් යන මැයෙන් අංක NDRSC/1/2/1 හා 2020.05.15 දිනැතිව නිකුත් කරන ලද ආපදා කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2020 අනුව ආපදා අවස්ථාවකදී සහන සැලසීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සඳහා මෙම මාර්ගෝපදේශය නිකුත් කරනු ලැබේ.

## 1. <u>මාර්ගෝපදේශයෙන් ආවරණය වන කරුණු</u>

### 1.1. ආවරණය වන ආපදා තත්ත්වයන්:-

අ. සුළි කුණාටු, කුණාටුව, චණ්ඩ මාරුත, ගංවතුර, නායයෑම්, සුළි සුළං, සුනාමි, අකුණු සැර, භූමි කම්පා, අනපේක්ෂිතව යම් දෙයක් වැටීම, වර්ෂාවෙන් තාප්ප කඩා වැටීම, තද සුළඟ නිසා ගස් කඩා වැටීම සහ ඊට සමාන වෙනත් ස්වාභාවික ආපදා හේතු කොටගෙන සිදුවන සියලුම ජීවිත හා දේපල හානි. (ගිනි ගැනීම් සහ මිනිසා විසින් නිර්මිත ආපදා තත්ත්වයන් මෙයින් ආවරණය නොවේ.)

ආ. දැඩි වියළි කාලගුණික තත්ත්වය/නියඟය

### 1.2. හිමිවන ප්‍රතිලාභ:-

i. කඩිනම් ආපදා සහන
ii. ස්වාභාවික ආපදාවක් හේතුවෙන් සිදුවන මරණ හා පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන් සඳහා වන්දි
iii. ස්වාභාවික ආපදාවක් හේතුවෙන් හානි වන නිවාස සහ ගෘහ උපකරණ සඳහා වන්දි
iv. ස්වාභාවික ආපදාවක් හේතුවෙන් හානිවන වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 10ට අඩු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට අයත් ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, භාණ්ඩ හා තොග සඳහා වන්දි
v. දැඩි වියළි කාලගුණ තත්ත්වය /නියඟය සඳහා පානීය ජලය

## 2. කඩිනම් ආපදා සහන

ස්වාභාවික ආපදා අවස්ථාවකදී ආපදාවට පත්වන පුද්ගලයන් සඳහා කඩිනම් ආපදා සහන සැලසීම සඳහා, දිස්ත්‍රික් ලේකම්ගේ හෝ ඔහුගේ බලය පවරා ඇති නිලධාරියකු විසින් සහතික කරන ලද ආපදා සිද්ධි වාර්තාව හා ඉල්ලීම් ලිපිය පදනම් කරගෙන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කරනු ලැබේ.

### 2.1. කඩිනම් සහන යටතේ ආවරණය වන කරුණු:-

ස්වාභාවික ආපදාවකින් බලපෑමට ලක්වන පවුල් සහ පුද්ගලයින් සඳහා පහත පරිදි සහන සැලසිය හැක.

පිසූ ආහාර ලබාදීම,

වියළි සලාක ලබාදීම,

පානීය ජලය ලබාදීම,

සුරක්ෂිත මධ්‍යස්ථානවල රඳවා ඇති ජනතාවට අවශ්‍ය වන මූලික පහසුකම් සපුරාලීම.

මෙහිදී මූලික අවශ්‍යතා යන්නට ඇඳුම් පැළඳුම්, සනීපාරක්ෂක ද්‍රව්‍ය, සනීපාරක්ෂක තුවා, මදුරු දඟර, ඉටිපන්දම්, ඇතිරිලි,පැදුරු ආදිය ඇතුලත් වන අතර මෙම ද්‍රව්‍යවලට අමතර ද්‍රව්‍ය මිලදී ගැනීමේදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙහි පූර්ව අනුමැතිය ලබාගැනීම සිදුකළ යුතුය.

#### (i) පිසූ ආහාර ලබාදීම

ආපදා තත්ත්වයකදී ආපදාවට ලක්වී තම ස්ථිර පදිංචි ස්ථානවලින් ඉවත් කර සුරක්ෂිත මධ්‍යස්ථානවල රඳවා ඇති පුද්ගලයන් හා තම නිවාසවල පිසූ ආහාර පිළියෙල කරගැනීමට නොහැකි ලෙස නිවාස ආපදාවෙන් බලපෑමට ලක්වී ඇති පුද්ගලයන් සියලුදෙනාටම ආදායම් මට්ටම නොසලකා පිසූ ආහාර සැපයිය යුතුය. ඒ සඳහා, එක් පුද්ගලයෙකු වෙනුවෙන් දිනකට රුපියල් 300/- ක උපරිමයකට යටත්ව වියදම් දැරිය හැකිය.

ප්‍රාදේශීය ලේකම්වරයාට සිය අභිමතය පරිදි දින 03ක උපරිමයක් දක්වා පිසූ ආහාර ලබාදීමට හැකි අතර, එතැන් සිට ඉදිරියට දින 4ක් දිසාපති/දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත පිසූ ආහාර ලබාදිය හැක. එතැන් සිට ඉදිරියට තවත් දින 7ක කාලයක් දක්වා පිසූ ආහාර ලබාදීමට අවශ්‍ය නම් ඒ සඳහා ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

#### (i) වියළි ආහාර ලබාදීම

ආපදා තත්ත්වයකදී සුරක්ෂිත මධ්‍යස්ථානවලට නොපැමිණ ඥාතීන්ගේ හෝ හිතවතුන්ගේ නිවෙස්වල රැඳී සිටින පවුල් වලට එම නිවෙස්වල ආහාර පිළියෙල කරගත හැකි බැවින් එම පවුල් සඳහා පිසූ ආහාර ලබාදෙන කාල පරාසයට සමාන කාල පරාසයකට වියළි සලාකයක් ලබාදිය හැකිය.

ආපදාවේ බලපෑම අවසන් වූ වහාම සුරක්ෂිත මධ්‍යස්ථානවල රඳවා සිටි පුද්ගලයන්/පවුල් තම නිවෙස්වලට පිටත් කර යැවිය යුතු අතර ඔවුන්ගේ ජන ජීවිතය යථාවත් කරගැනීම සඳහා අවශ්‍යතාවය අනුව සතියක කාලයක් දක්වා වියළි සලාකයක් ලබාදීම සිදුකළ හැකිය.

ඥාතීන්ගේ හෝ හිතවතුන්ගේ නිවෙස්වල රැඳී සිට ආපදාවේ බලපෑම අවසන් වූ වහාම තම නිවෙස්වලට යන පුද්ගලයන් /පවුල් සඳහාද ඔවුන්ගේ ජන ජීවිතය යථාවත් කරගැනීම සඳහා අවශ්‍යතාවය අනුව සතියක කාලයක් දක්වා වියළි සලාකයක් ලබාදීම සිදුකළ හැකිය.

ආපදාවට ලක්වූ පුද්ගලයන් /පවුල් වෙත සතියකට වඩා වැඩි කාලයක් සඳහා වියළි ආහාර ලබාදිය යුතු අවස්ථාවකදී ආපදා සිද්ධි වාර්තාව සමඟ අදාළ ඉල්ලීම ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඒ සඳහා පූර්ව අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය.

**වියළි සලාක වෙනුවෙන් සතියකට වැය කල හැකි උපරිම මුදල**

| | රුපියල් |
|---|---|
| තනි පුද්ගලයකු සඳහා | 900 |
| සාමාජිකයන් 02 කින් යුත් පවුලකට | 1,200 |
| සාමාජිකයන් 03 කින් යුත් පවුලකට | 1,400 |
| සාමාජිකයන් 04 කින් යුත් පවුලකට | 1,600 |
| සාමාජිකයන් 05 කින් යුත් පවුලකට | 1,800 |

වියළි සලාක ලබාදීම සඳහා විවිධ සේවා සමුපකාර සහ සතොස අලෙවි සැල් වලින් ඍජුවද, එයට අමතරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ මිල ගණන් කැඳවා බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිලදී ගැනීම් සිදු කළ හැකිය.

**2.2. කඩිනම් සහන සඳහා මුදල් ඉල්ලුම් කිරීමට අවශ්‍ය ලේඛන:-**

i. දිස්ත්‍රික් ලේකම් විසින් සහතික කරන ලද ආපදා සිද්ධි වාර්තාව (ජා.ආ.ස.සේ.ම. 16) හා ඉල්ලීම් ලිපිය
ii. ජා.ආ.ස.සේ.ම. 1 ආකෘතිය

**2.3. කඩිනම් සහන සඳහා මුදල් ලබාදීමේ ක්‍රමවේදය:-**

i. ආපදාව සිදු වී පැය 24ක් ඇතුලත ග්‍රාම නිලධාරීගේ තොරතුරු පදනම් කරගනිමින් ප්‍රාදේශීය ලේකම් හෝ බලය පවරන ලද නිලධාරියකු විසින් ආපදා සිද්ධි වාර්තාව (ජා.ආ.ස.සේ.ම. 15) ආකෘතියට අනුව අදාළ දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කළ යුතු අතර එම තොරතුරු පදනම් කරගනිමින් දිස්ත්‍රික් ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම්ගේ බලය පවරන ලද නිලධාරියකු විසින් ඉහත සඳහන් කර ඇති ලේඛන (ජා.ආ.ස.සේ.ම. 15 හා 16) ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කළ යුතුය.
ii. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත අවශ්‍ය ප්‍රතිපාන නිකුත් කරනු ලබන අතර දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රතිපාදන ලැබී දිනක් ඇතුලතදී ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත එම ප්‍රතිපාදන නිකුත් කිරීම සිදු කළ යුතුය.
iii. දිවයිනටම බලපාන විස්තීරණ ආපදා තත්වයකදී ඉහත ක්‍රමවේදයෙන් බැහැරව ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් කඩිනම් සහන සැලසීම සඳහා අවශ්‍යතාවය අනුව අත්තිකාරම් මුදලක් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදීමට කටයුතු කරනු ඇත.

### 2.4. කඩිනම් සහන මුදල් පියවීම

විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවකදී දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද ප්‍රතිපාදනවලට අදාල වියදම් වාර්තා ජා.ආ.ස.සේ.ම.13 ආකෘතියෙන් මාසිකව ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත අනිවාර්යයෙන්ම යොමුකළ යුතුය.

| |
|---|
| සැ.යු.- අවශ්‍ය වුවහොත් පරීක්ෂා කිරීම සඳහා බිල්පත්වල මුල් පිටපත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගණකාධිකාරි යටතේ තිබිය යුතුය. |

## 3. <u>මියගිය හා පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වන පුද්ගලයන් සඳහා වන්දි ලබාදීම</u>

ඉහත 1.1. හි සඳහන් කර ඇති ස්වාභාවික ආපදාවක් හේතුවෙන් සිදුවන මරණයක් හෝ පූර්ණ ආබාධිත තත්ත්වයකට පත්වන පුද්ගලයන් සඳහා රුපියල් 250,000/-ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට කටයුතු කළ හැකිය.

මරණයකදී මියගිය පුද්ගලයාගේ අවමංගල්‍ය කටයුතු සිදුකිරීම සඳහා රුපියල් 15,000/- ක අත්තිකාරම් මුදලක් මූලිකවම ලබාදිය යුතු අතර, අදාළ මරණය ස්වාභාවික ආපදාවක් හේතුවෙන් සිදුවූ බවට තහවුරු කරගැනීමෙන් අනතුරුව පමණක් එම අත්තිකාරම් මුදල ගෙවිය යුතුය.

සම්පූර්ණ කරන ලද මරණ වන්දි අයදුම් පත්‍රය සමඟ අදාළ සියලුම ලේඛන මරණය සිදුවී සති 02ක් ඇතුලත ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය.

ඉන් අනතුරුව මරණ වන්දි සඳහා ගෙවිය යුතු ඉතිරි රුපියල් 235,000/-ක වන්දි මුදල සඳහා වන ප්‍රතිපාදන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදෙනු ලැබේ.

වෛද්‍ය වාර්තාව සමඟ අදාල ලේඛණ යොමු කළ පසු පූර්ණ ආබාධිත වන්දි සඳහා ගෙවිය යුතු රුපියල් 250,000/-ක වන්දි මුදල සඳහා වන ප්‍රතිපාදන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ලබාදෙනු ලැබේ.

### 3.1. වන්දි අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලේඛන:-

i. ආපදා සිදුවීමට අදාළ ආපදා සිද්ධි වාර්තාව. (ජා.ආ.ස.සේ.ම. 16)
ii. දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීම් ලිපිය.
iii. මරණ/පූර්ණ ආබාධිත හිමිකම් අයදුම් පත්‍රය (ජා.ආ.ස.සේ.ම.30)
iv. මිය ගිය/පූර්ණ ආබාධිත පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත.
v. මිය ගිය පුද්ගලයාගේ මරණ සහතිකයෙහි සහතික කළ පිටපත.
vi. නීතිමය උරුමකරුවන්ගේ ඥාතීත්වය සනාථ කිරීමට අදාළ ලේඛණවල සහතික කළ පිටපත්.උදාහරණ - උප්පැන්න සහතිකය, විවාහ සහතිකය.
vii. නීතිමය උරුමකරුගේ බැංකු ගිණුම් පාස් පොතෙහි මුල් පිටුවෙහි සහතික කළ පිටපත.
viii. පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම මත වන්දි අයදුම් කිරීමේදී ඒ සඳහා වන රජයේ වෛද්‍ය සහතිකය (අනිවාර්යය වේ).

**4. දේපළ හානි සඳහා වන්දි ලබාදීම**

ස්වාභාවික ආපදාවකින් හානියට පත් දේපළ සඳහා වන්දි ලබා දීමේදී ස්වාභාවික ආපදාවක් හේතුවෙන් අදාළ දේපළවලට සිදුවූ හානිය ප්‍රතිපූරණය කිරීම සඳහා (indemnity basis) වන්දි ලබා දීමට කටයුතු කරනු ලැබේ.

I. චක්‍රලේඛයෙන් ආවරණය වන දේපල සඳහා වන්දි ලබාදීමේ සීමාවන්

i. ස්වාභාවික ආපදාවක් හේතුවෙන් හානි වන නිවසවල ගොඩනැගිලි හා එම නිවසෙහි ගෘහ උපකරණ හානි සඳහා - උපරිමය රුපියල් මිලියන 2.5 කි.
එයින්, ගෘහ උපකරණ හානි සඳහා ගෙවිය හැකි උපරිම වන්දි මුදල - රුපියල් 25,000/-කි.

ii. ස්වාභාවික ආපදාවක් හේතුවෙන් හානිවන වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 10ට අඩු ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ගොඩනැගිලි සඳහා - උපරිමය රුපියල් මිලියන 2.5 කි.
එයින්, යන්ත්‍රෝපකරණ, භාණ්ඩ හා තොග සඳහා - උපරිමය රුපියල් 100,000/-කි.

II. මාර්ගෝපදේශයෙන් ආවරණය වන දේපල

| නිවාස යටතේ | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යටතේ ආවරණය වන දේපල |
|---|---|
| i. නිවස (ගොඩනැගිල්ල) | i. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරය (ගොඩනැගිල්ල) |
| ii. නිවසෙහි ගෘහ උපකරණ හා විදුලි උපකරණ, විදුලි පරිපථ | ii. ක්ෂුද්‍ර,සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරය සතුව පැවති යන්ත්‍රෝපකරණ |
| iii. වැසිකිළි (නිවසට ඇඳුණු හා නිවසින් පිටත පිහිටි) | ii. ක්ෂුද්‍ර,සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරය සතුව පැවති භාණ්ඩ හා තොග |
| iv. ළිං (පානීය ජලය ලබාගැනීම සඳහා භාවිතා කරන්නේ නම් පමණි) | |
| v. නිවස හා සම්බන්ධ(නිවසට ඇඳා ඇති) වෙනත් ඉදිකිරීම් | |

## III. දේපල හානි තක්සේරු කිරීම, අත්තිකාරම් හා වන්දි මුදල් ගෙවීමේ කාලය හා අවශ්‍ය ලේඛන.

වගුව: 1

| හානියේ ස්වභාවය හෝ තක්සේරුවේ වටිනාකම | තක්සේරු කමිටුවේ සංයුතිය | වන්දි ලබාදීමේ කාල සීමාව හා අවශ්‍ය ලේඛන |
|---|---|---|
| තක්සේරු වටිනාකම රුපියල් 10,000/- දක්වා වන්දි හා දළ වශයෙන් රුපියල් 10,000/- ට වැඩි නිවාස හානි සඳහා අත්තිකාරම් | **වගුව 1.1**<br>• අදාළ වසමේ ග්‍රාම නිලධාරී<br>• ආපදා සහන සේවා නිලධාරී<br>• වසමේ සංවර්ධන නිලධාරී හෝ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර හෝ සමෘද්ධි සංවර්ධන නිලධාරී | **වගුව 1.2**<br>අත්තිකාරම් මුදල් ගෙවීම සඳහා මුදල් ලැබී දින 02ක් තුළ ගෙවීම් කටයුතු ආරම්භ කර දින 07ක් තුළ ගෙවා අවසන් කළ යුතුය.<br>• සම්පූර්ණ කරන ලද ජා.ආ.ස.සේ.ම. 09 (I) අයදුම්පත්‍රය<br>• හානියට පත් දේපළෙහි ඡායාරූප 02 |
| තක්සේරු වටිනාකම රුපියල් 10,000/- සිට රුපියල් 25,000/- දක්වා වූ නිවාස හානි හෝ රුපියල් 25,000/- දක්වා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි | **වගුව1.3**<br>• අදාළ වසමේ ග්‍රාම නිලධාරී<br>• තාක්ෂණික නිලධාරී<br>• ආපදා සහන සේවා නිලධාරී | **වගුව 1.4**<br>ආපදාව සිදුවී සති 02ක් තුළ ගෙවීම් කටයුතු ආරම්භ කර මාසයක් ඇතුලතදී අවසන් කළ යුතුය.<br>• සම්පූර්ණ කරන ලද ජා.ආ.ස.සේ.ම. 09 (V) හෝ ජා.ආ.ස.සේ.ම. (VI) අයදුම්පත්‍රය<br>• අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත<br>• හානියට පත් දේපළෙහි ඡායාරූප 02<br>• දේපළ අයිතිය සනාථ කෙරෙන ලියවිලි, ඔප්පු පිටපත් |
| තක්සේරු වටිනාකම රුපියල් 25,000/- ට වැඩි නිවාස හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි | **වගුව1.5**<br>• අදාළ වසමේ ග්‍රාම නිලධාරී<br>• තාක්ෂණික නිලධාරී<br>• ආපදා සහන සේවා නිලධාරී<br>• දිස්ත්‍රික් ලේකම් විසින් නම්කරනු ලබන තාක්ෂණික නිලධාරියකු හෝ මාණ්ඩලික නිලධාරියකු<br><br>* ඉහත නිලධාරීන්ට අමතරව අවශ්‍යතාවය අනුව ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් නියෝජිතයකු නම් කිරීමට කටයුතු කරනු ලැබේ. | **වගුව 1.6**<br>ආපදාව සිදුවී මසක් ඇතුලතදී අයදුම්පත්‍රයෙහි සහතික කරන ලද පිටපතක් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට යොමු කළ යුතුය.<br>• සම්පූර්ණ කරන ලද ජා.ආ.ස.සේ.ම. 09 (V) හෝ ජා.ආ.ස.සේ.ම. (VI) අයදුම්පත්‍රය<br>• අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත<br>• හානියට පත් දේපළෙහි ඡායාරූප 03<br>• දේපළ අයිතිය සනාථ කෙරෙන ලියවිලි, ඔප්පු පිටපත් |

හානි තක්සේරු කිරීම සඳහා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මඟින් ඔබ වෙත යොමු කර ඇති හානි ප්‍රතිපූර්ණය කිරීමේ පිරිවැය ඇස්තමේන්තු මාර්ගෝපදේශය භාවිත කළ යුතු අතර එම මාර්ගෝපදේශයට වරින් වර සිදු කරන සංශෝධන ඔබ වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

## IV. නිවාස හානි සඳහා රුපියල් 10 000/- දක්වා අත්තිකාරම් මුදල් ලබාදීම

ස්වාභාවික ආපදාවකින් හානියට පත් නිවාස කඩිනමින් පිළිසකර කර ගැනීම සඳහා හානියේ ස්වභාවය දළ වශයෙන් රුපියල් 10,000/-ට වැඩි වන අවස්ථාවේදී රුපියල් 10,000/-ක අත්තිකාරම් මුදලක්ද, හානියේ ස්වභාවය රුපියල් 10,000/-ට අඩු වන අවස්ථාවලදී ඊට අදාළ එම මුදල වන්දි වශයෙන්ද ගෙවීම් කළ හැකිය.

| |
|---|
| ස්වාභාවික ආපදාවකින් හානියට පත් වන වතු නිවාස හා අනවසර ඉදිකිරීම් ලෙස පවතින නිවාසවල පදිංචිකරුවන් සඳහා ආපදාවේ බලපෑම අනුව එම නිවාස යථාවත් කරගැනීම සඳහා දීමනාවක් ගෙවිය යුතු බවට අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා තීරණය කරනු ලබන අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ සමග ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව පමණක් උපරිම රුපියල් 10,000/-ක් දක්වා මුදලක් ගෙවීම් කළ හැකිය. |

## V. අත්තිකාරම් මුදල් අයදුම් කිරීම.

i. ආපදාව සිදු වී පැය 24 ක් ඇතුලත ග්‍රාම නිලධාරී තොරතුරු පදනම් කරගනිමින් හානිවූ නිවාස සංඛ්‍යාව ඇතුලත් කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කරන ලද ආපදා සිද්ධි වාර්තාව අනුව සකස් කරන ලද දිස්ත්‍රික් ආපදා සිද්ධි වාර්තාව හා දිස්ත්‍රික් ලේකම්ගේ ඉල්ලීම් ලිපිය සමඟ එම නිවාස සඳහා ගෙවීම් කිරීමට අවශ්‍ය අත්තිකාරම් මුදල් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ඉල්ලීම් කළ යුතුය.

ii. අදාළ ලේඛන ලැබුණු වහාම ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් එම මුදල් ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත නිකුත් කිරීම සිදුකරයි.

iii. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රතිපාදන ලැබී දිනක් ඇතුලතදී ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන නිකුත් කළ යුතුය.

iv. ආපදාව සිදුවූ වහාම ඉහත 1.1 වගුවෙහි දක්වා ඇති කමිටුව ප්‍රාදේශීය ලේකම් විසින් පත්කළ යුතු අතර එම කමිටුව මඟින් ජා.ආ.ස.සේ.ම. 9 (I) අයදුම්පත්‍රය නිර්දේශ සහිතව සම්පූර්ණ කර ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

v. දිස්ත්‍රික් ලේකම් වෙතින් මුදල් ලැබී දින 02ක් ඇතුලතදී ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව අදාළ ප්‍රතිලාභීන් වෙත අත්තිකාරම් ගෙවීම ආරම්භ කර දින 07ක් ඇතුලතදී අත්තිකාරම් මුදල් ලබාදී අවසන් කළ යුතුය.

vi. ජා.ආ.ස.සේ.ම. 9 (i) අයදුම්පත්වලට අදාළ තොරතුරු ආපදාව සිදුවී සති 02ක කාලයක් ඇතුලත නිවාස හානි තක්සේරු මාර්ගගත දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුය.

## VI. අත්තිකාරම් මුදල් පියවීම

විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවකදී ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් මුදල් නිකුත් කළ දින සිට දින 30ක් ඇතුලතදී අත්තිකාරම් පියවීමට අදාළ ඉතිරි ප්‍රතිපාදන ජා.ආ.ස.සේ.ම. 25 (ii) ආකෘතිය සමග ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමුකිරීම අනිවාර්යය වේ. ජා.ආ.ස.සේ.ම. 9 (i) අයදුම්පත් වල මුල් පිටපත් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබාගත යුතුය.

## VII. <u>රුපියල් 25,000/- දක්වා දේපළ හානි තක්සේරු සඳහා වන්දි මුදල් ලබාදීම</u>

ස්වාභාවික ආපදාවන්ගෙන් හානියට පත් තක්සේරු වටිනාකමරු.10,000/- සිට රු.25,000/- දක්වා වන නිවාස හානි සහ තක්සේරු වටිනාකම රුපියල් 25,000/- දක්වා වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන්දි ලබාදීමද අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කළ යුතු වේ.

නිවාස හානි සඳහා වන්දි මුදල ලබාදීමේදී ගෙවන ලද අත්තිකාරම් මුදල අඩු කිරීමෙන් පසුව ඉතිරි මුදල පමණක් ගෙවීම් කළ යුතුය.

උදා:- හානිපූර්ණය සඳහා තක්සේරු කරන ලද දේපල හානිය රු.18,500/-ක් නම්, රු.10,000/- අත්තිකාරම් ලෙස මුලින් ලබාදී ඇත්නම් ඉල්ලුම් කළ යුත්තේ රු.8,500/-ක් පමණි.

| |
|---|
| සැ.යු.- විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවකදී රුපියල් 10,000 සිට රුපියල් 25,000 දක්වා නිවාස හානි තක්සේරු සඳහා වන්දි මුදල් ආපදාව සිදුවී දින 30ක් ඇතුලත ගෙවා අවසන් කිරීම අත්‍යවශ්‍ය වේ. |

## VIII. <u>රු. 25,000/- දක්වා වන්දි මුදල් අයදුම්කිරීම හා ප්‍රතිලාභීන් වෙත ලබාදීම</u>

i. ආපදාව සිදුවීමෙන් අනතුරුව ඉහත 1.3 වගුවේ සඳහන් කමිටුව ප්‍රාදේශීය ලේකම් විසින් පත්කළ යුතු වේ. එම කමිටුව මගින් ජා.ආ.ස.සේ.ම. 9 (V) හෝ(VI) අයදුම්පත්‍ර සම්පූර්ණ කර නිර්දේශ සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතුය. එයට අදාළ ලේඛන අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය.

ii. ප්‍රාදේශීය ලේකම් විසින් එම නිර්දේශ පදනම් කරගනිමින් ගෙවිය යුතු වන්දි මුදල තීරණය කළ යුතු අතර ඒ සඳහා අනුමැතිය ලබාදිය යුතුය.

iii. ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර ඇති වන්දි මුදල ජා.ආ.ස.සේ.ම. 9 (III)-1 ආකෘති පත්‍රය මගින් ආපදාව සිදු වී සති 02ක් ඇතුලත ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් ඉල්ලීම් කළ යුතුය.

iv. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් විසින් එක් දිනක් ඇතුලත මෙම ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

v. අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත මුදල් ලැබී දින 02ක් ඇතුලත අදාල ප්‍රතිලාභීන් වෙත මුදල් ලබා දීම ආරම්භ කළ යුතු අතර අදාල වන්දි ලබාදීම දින 10ක් ඇතුලත අවසන් කළ යුතුය.

vi. වන්දි ගෙවීම අවසන් කර ජා.ආ.ස.සේ.ම. 9 (V) හෝ (VI) අයදුම්පත්වලට අදාළ තොරතුරු ආපදාව සිදුවී දින 30ක කාලයක් ඇතුලත නිවාස හානි තක්සේරු දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුය.

## IX. <u>රුපියල් 25,000/- ට වැඩි දේපළ හානි තක්සේරු සඳහා වන්දි මුදල් ලබාදීම</u>

ස්වාභාවික ආපදාවන්ගෙන් හානියට පත් හානි තක්සේරු වටිනාකම රුපියල් 25,000/- ට වැඩි නිවාස හා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන්දි ලබාදීමද අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කළ යුතු වේ මෙහිදී දේපළ හානිය <u>ප්‍රතිපූරණය කිරීමට</u> පමණක් අදාලව වන්දි මුදල් දේපල අයිතිකරු වෙත ලබා දෙනු ලැබේ.

## X. රු. 25,000/- ට වැඩි වන්දි මුදල් අයදුම්කිරීම හා ප්‍රතිලාභීන් වෙත ලබාදීම

I. ආපදාව සිදුවීමෙන් අනතුරුව ඉහත 1.5 වගුවේ සඳහන් කමිටුව ප්‍රාදේශීය ලේකම් විසින් පත්කළ යුතු වේ.එම කමිටුව මගින් ජා.ආ.ස.සේ.ම. 9 (V) හෝ(VI) අයදුම්පත්‍ර සම්පූර්ණ කර නිර්දේශ සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කළ යුතුය. එයට අදාළ ලේඛන අයදුම්පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය.

II. විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවකදී ආපදාව සිදුවූ දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහිත ජා.ආ.ස.සේ.ම. 9 (V) හා 9 (VI) අයදුම්පත්හි සහතික කල පිටපත්, ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර ඇති වන්දි මුදල ඇතුලත් ජා.ආ.ස.සේ.ම. 9 (III)-1 ආකෘති පත්‍රය සමග දිස්ත්‍රික් ලේකම් මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

III. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය මගින් සති දෙකක කාලයක් තුලදී ප්‍රතිලාභීන්ට වන්දි ගෙවීම් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් වෙත යොමු කරනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් විසින් දිනක් ඇතුලත එම ප්‍රතිපාදන ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදිය යුතුය. එම ප්‍රතිපාදන ලැබී දින 07ක් ඇතුලත චෙක්පත් මගින් ප්‍රතිලාභීන්ට වන්දි මුදල් ලබාදීම සිදුකළ යුතුය.

IV. චෙක්පත් ලබාගත් ප්‍රතිලාභී අත්සන් ලේඛනයේ සහතික කරන ලද පිටපත චෙක්පත් ප්‍රතිලාභීන් වෙත බෙදාදී දින 30ක් ඇතුලත ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

V. ජා.ආ.ස.සේ.ම. 9 (V) හා (VI) අයදුම්පත්වලට අදාළ තොරතුරු ආපදාව සිදුවී දින 30ක කාලය ඇතුලත නිවාස හානි තක්සේරු දත්ත පද්ධතියට ඇතුලත් කළ යුතුය.

**සටහන:** ජා.ආ.ස.සේ.ම. 9 (V) හා (VI) අයදුම්පත්හි පහත අවශ්‍යතා සපුරා තිබීම අනිවාර්යය වේ.

- ජාතික හැඳුනුම්පත් අංකය මගින් අදාල අයදුම්පත් පරිගණක ගත කරන බැවින්,ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ. (පුද්ගලයාට අදාළ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ නොහැකි නම් අදාළ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් රියදුරු බලපත්‍රය, විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු ලියවිල්ලකින් සනාථ කරගන්නා ලද ජාතික හැඳුනුම්පත් අංකය අයදුම්පතට ඇතුලත් කළ යුතු අතර අදාළ ලියවිල්ලෙහි ඡායා පිටපතක්ද ඇමිණිය යුතුය)
- ජාතික හැඳුනුම්පත් අංකයක් නොමැති අවස්ථාවකදී, ජාතික හැඳුනුම්පත් අංකයක් ඇති පවුලේ වෙනත් සාමාජිකයකුගේ හෝ ඥාතියකුගේ නමින් අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා බලය පැවරූ දිවුරුම් ප්‍රකාශයක් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය.
- දේපල අයිතිය තහවුරු කිරීමට ඔප්පු පිටපත් හෝ වෙනත් නීත්‍යානුකල ලියවිලි, හානිය තහවුරු කිරීමට ඡායාරූප 3ක් හා වෙනත් අදාල ලියවිලි අයදුම්පත්‍රය සමඟ අනිවාර්යයයෙන්ම ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පතේ සියළු තොරතුරු සම්පූර්ණ කිරීම අනිවාර්යය වේ.

  උදා : අදාල දේපල සම්බන්ධව වෙනත් රක්ෂණාවරණයක් ලබා ගෙන තිබේද යන්න,
  දේපල තත්වය - ස්ථිර / තාවකාලික
  හානි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස
  ව්‍යාපාරයේ වාර්ෂික පිරිවැටුම /ආදායම
  නිවසේ /දේපලෙහි වරිපනම් අංකය ආදී

- 1.5 වගුවෙහි සඳහන් තක්සේරු කමිටු සාමාජිකයන් සියලුදෙනාම අදාල දේපළ පරීක්ෂා කළ බවට/තක්සේරු කළ බවට අත්සන් තැබිය යුතු අතර, ප්‍රාදේශීය ලේකම් විසින් එය අනුමත කළ යුතු වේ.

- ඔප්පුවේ නම සඳහන් අයිතිකරුගේ නමින්ම දේපල හානි අයදුම්පත ඉදිරිපත් කිරීම පහසුවන අතර, එසේ නොවන අවස්ථාවලදී ඥාතිත්වය තහවුරු කිරීමට ග්‍රාම නිලධාරී අත්සන සහ නිල මුද්‍රාව ප්‍රාදේශීය ලේකම් අත්සන සහ නිල මුද්‍රාව සහිතව සහතික කරන ලිපියක් අමුණා තිබීම අනිවාර්යය වේ.

## 5. අභියාචනා යොමු කිරීම

ස්වාභාවික ආපදාවකින් හානියට පත්වන දේපළ වලටවන්දි මුදල් පිරිනැමීම සම්බන්ධව ප්‍රතිලාභීන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා ජා.ආ.ස.සේ.ම. 24 ආකෘතිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම්ගේ හෝ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සමඟ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයට යොමු කළ යුතුය.

## 6. <u>තක්සේරු අයදුම්පත් මාර්ග ගත තොරතුරු පද්ධතියට (Online Application Submission System) ඇතුලත් කිරීම.</u>

ජා.ආ.ස.සේ.ම. 9 (I),ජා.ආ.ස.සේ.ම. 9 (V) හා (VI)අයදුම්පත්හිපහත සඳහන් තොරතුරු මාර්ග ගත තොරතුරු පද්ධතියට **(Online Application Submission System)** ඇතුලත් කළ යුතු වේ.

| මූලික තොරතුරු | අයදුම්පතෙහි අංකය | අයදුම්පත්‍ර අනු අංකය |
|---|---|---|
| • ආපදාව (situation) | 9(i), | 1.1 |
| • කාලවකවානුව (Period) | 9(i), | 1.2 |
| • දිස්ත්‍රික්කය (District) | 9(i), | 1,3 |
| • ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (DS Division) | 9(i), | 1.4 |
| • ග්‍රාම නිළධාරීකොට්ඨාශය (GN Division) | 9(i), | 1.5 |
| • ග්‍රාම නිළධාරී කොට්ඨාශ අංකය (GN Number) | 9(i), | 1.6 |
| • ඉල්ලුම් කරුගේ නම (Applicant Name) | 9(i), | 2.0 |
| • හැදුනුම්පත් අංකය (ID Number) | 9(i), | 2.1 |
| • ලිපිනය (Address) | 9(i), | 2.2 |
| • ජංගම දුරකථන අංකය (Mobile Number) | 9(i), | 2.3 |
| • හානි වූ දේපළ හා හානි වූ දේපළ කොටස පිළිබඳ විස්තර (Property details) | | |
| ▪ දේපල සඳහා අයිතිවාසිකම (ownership) | 9(i), | 3.1 |
| ▪ නිවසේ තත්ත්වය (Category) | 9(i), | 3.2 |
| ▪ මුළු බිම් ප්‍රමාණය (වර්ග අඩි) (Floor Area) | 9(i), | 3.3 |
| ▪ නිවාස වර්ගය (Category) | 9(i), | 3.4 |
| ▪ මහල් සංඛ්‍යාව (storey) | 9(i), | 3.5 |
| • හානි වූ දේපළ කොටස පිළිබඳ විස්තර (Property details) | | |
| ▪ වහළ (Roof) | 9(i), | 4.1 |
| ▪ බිත්තිය (Wall | 9(i), | 4.2 |
| ▪ බිම (Floor) | 9(i), | 4.3 |
| • අත්තිකාරම් මුදල් ලබා දීම පිළිබඳ තොරතුරු (Advanced Payment) | | |
| ▪ ලබා දුන් මුදල (Advanced Amount) | 9(i), | 9.1 |
| ▪ අත්තිකාරම් වර්ගය (Advance type) | 9(i), | 9.1 |
| ▪ දිනය (Date paid) | 9(i), | 9.1 |
| • කමිටු සාමාජිකයින් නම් හා තනතුරු (Committee Details) | 9(i), | 9.1 |
| • අයදුම්පත්‍රයට අදාල සියළුම ඡායාරූපයන් (Images) | 9(v), | 5.3 |
| (හානියේ ස්වභාවය දැක්වෙන ඡායාරූප දෙකක් පද්ධතියට ඇතුලත් කළ යුතුය.) | | |
| • තක්සේරුව (Assessment) | | |
| ▪ ආපදාවේ ස්වභාවය (Disaster Type) | 9(v), | 1.1 |
| ▪ සිදු වූ කාල වකවානුව (period) | 9(v), | 1.2 |
| ▪ නිවාස හානියේ ප්‍රතිශතය (Percentage of Property damage) | 9(v), | 5.4 |
| ▪ අනුමත කරන ලද මුදල (Recommended claim amount | 9(v), | 10.4 |
| ▪ නිර්දේශ කරන ලද දිනය ( Date of examined) | 9(v), | 10.6 |
| ▪ බැංකු ගිණුම් විස්තර (Banking Information) | 9(v), | 8 |
| ○ බැංකු ගිණුම් අංකය (Bank account number) | 9(v), | 8.1 |
| ○ මුලකුරු සමඟ ගිණුම් හිමියාගේ නම (Name in the bank account) | 9(v), | 8.2 |
| ○ ගිණුම් වර්ගය (Type of account) | 9(v), | 8.3 |
| ○ බැංකුවේ නම (Name of the bank) | 9(v), | 8.4 |

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හානි තක්සේරු තොරතුරු ඇතුළත් කිරීමේදී 9(vi) අයදුම්පත්‍රයේ 6.1, 6.2 ,6.3, 6.4, 7.1, 10, 10.1 11.1, 11.2, 11.3, 11.4, 11.7 තොරතුරු හැර ඉතිරි සියළු තොරතුරු ඇතුළත් කළ යුතුය.

## 7. නියගය පවතින ප්‍රදේශවල පානීය ජලය බෙදා හැරීම

### 7.1. පානීය ජලය බෙදා හැරීම

දැඩි වියළි කාලගුණික තත්ත්වයක් හෝ නියං ආපදා තත්ත්වයක් බලපැවැත්වෙන ප්‍රාදේශිය ලේකම්කොට්ඨාසවල ජනතාවට පානීය ජලය සපයා ගැනීම සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති අවස්ථාවන් වලදී පමණක් පීඩාවට පත්වන ජනතාව සඳහා පානීය ජලය සැපයීම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුකළ යුතුය .

දැඩි වියළි කාලගුණික තත්ත්වයක් හෝ නියං ආපදා තත්ත්වයක්තුල පානීය ජලය සපයා දීම සඳහා අවශ්‍ය මුදල් මහා භාණ්ඩාගාරය විසින් ආපදා කළමනාකරණ විෂය අයත් අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය යටතේ ඇති ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත ලබා දීමට ක්‍රියා කරනු ඇත.

පානීය ජලය බෙදාහැරීම සඳහා යොදාගනු ලබන ජල බවුසර් රථවලට වැය වන ඉන්ධන වියදම්, රියදුරු සහ රිය සහයකයන් සඳහා ගෙවනු ලබන වැටුප්, දීමනා හා අතිකාල දීමනා සහ පානීය ජලය බෙදාදීමේදී වැයවන වෙනත් අත්‍යවශ්‍ය වියදම් දැරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන ලබාදීම සිදුකරනු ලැබේ. ඒ අනුව, දිස්ත්‍රික් ලේකම්වරුන් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය.

මෙයට අමතරව නියං තත්ත්වයක් හේතුවෙන් අඩාල වන ජන ජීවිතය යථාවත් කිරීම සඳහා තවදුරටත් සහන සැලසිය යුතු බවට රජය විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී ඒ සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් පියවර ගත යුතුය.

### 7.2. පානීය ජලය බෙදාහැරීමට අදාළ වියදම් පියවීම සඳහා ප්‍රතිපාදන ඉල්ලීම් ඉදිරිපත් කල යුතු ආකාරය.

01. ග්‍රාම නිලධාරී විසින් තම අත්සන සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද ජා.ආ.ස.සේ.ම. ආකෘති පත්‍ර අංක 18 මඟින් තම වසමට අදාළ පානීය ජල අවශ්‍යතාවය පිළිබඳ විස්තර (පීඩාවට පත් පවුල් ගණන, පීඩාවට පත් පුද්ගලයින් ගණන, දිනකට අවශ්‍ය ජල පරිමාව, පානීය ජලය සැපයීමට අදහස් කරන කාල සීමාව ආදිය) සහිත ඉල්ලීම ප්‍රාදේශිය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

02. ග්‍රාම නිලධාරීන් විසින් ජා.ආ.ස.සේ.ම. ආකෘති පත්‍ර අංක 18 මඟින් කරනු ලබන ඉල්ලීම් වල ඇතුලත් තොරතුරු පදනම් කර ගනිමින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් තම කොට්ඨාසයට අදාළ පානීය ජල අවශ්‍යතාවය කමිටුවක් මඟින් තක්සේරු කළ යුතුය. එම කමිටුවේ සභාපති ලෙස ප්‍රාදේශිය ලේකම් කටයුතු කළ යුතු අතර, ආපදා සහන සේවා නිලධාරී එහි සාමාජිකයකු ලෙස සහභාගි විය යුතුය. එහිදී, ප්‍රාදේශිය ලේකම්ගේ අත්සන සහිතව නිවැරදිව සකස් කරනු ලබන ජා.ආ.ස.සේ.ම. ආකෘති පත්‍ර අංක 19 ආවරණ ලිපියක්ද සහහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කළ යුතුය.

03.දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කර යොමු කර ඇති ජා.ආ.ස.සේ.ම.ආකෘති අංක 19හි ඇතුලත් තොරතුරු පදනම් කර ගනිමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ජා.ආ.ස.සේ.ම. ආකෘති පත්‍ර අංක 20 මඟින් දිස්ත්‍රික්කය සඳහා පානීය ජලය බෙදා හැරීමට අවශ්‍ය මුළු ප්‍රතිපාදන ගණනය කළ යුතුය. දිස්ත්‍රික් ලේකම්ගේ අත්සන සහිතව සකස් කළ ජා.ආ.ස.සේ.ම.ආකෘති පත්‍ර 20 ආවරණ ලිපියක්ද සහිතව ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

04.දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් සිය අත්සන සහිතව ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබන ජා.ආ.ස.සේ.ම. ආකෘති පත්‍ර අංක 20හි ඇතුලත් තොරතුරු සැලකිල්ලට ගෙන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ.

### 7.3. පානීය ජලය බෙදා හැරීම සඳහා රියදුරන් හා රිය සහායකයින් තාවකාලික පදනමින් යොදවා ගැනීම

පානීය ජලය බෙදාහැරීමේ කටයුතු සඳහා රාජ්‍ය සෙවයේ ස්ථිර රාජකාරීවල නිරත රියදුරන් හා රිය සහායකයින් යොදා ගැනීමට හැකි සෑම විටම පියවර ගත යුතු අතර එසේ නොහැකි සුවිශේෂී අවස්ථාවලදී පමණක් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ පූර්ව අනුමැතිය මත පමණක් තාවකාලික පදනමින් රියදුරන් හා රිය සහායකයින් සේවයේ යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. එසේ යොදවා ගනු ලබන රියදුරන් හා රිය සහායකයින් සඳහා දිස්ත්‍රික් මිල කමිටුවේ අනුමත මිල ගණන් යටතේ ගෙවීම් කළ යුතුය.

### 7.4. පානීය ජලය බෙදා හැරීමේ කටයුතුවල නිරත රියදුරන් හා රිය සහායකයින් සඳහා අතිකාල දීමනා ගෙවීම සිදු කල යුතු ආකාරය.

පානීය ජලය බෙදා හැරීමේ රාජකාරී කටයුතු වල නිරත රියදුරන් හා රිය සහායකයින් සඳහා ලිත් මසකට පැය 100ක් දක්වා වූ අතිකාල ගෙවීම් දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතියෙන් ගෙවීම් කළ හැකි අතර, එක් නිලධාරියෙකු විසින් ලිත් මසක් තුළ සිදුකරනු ලබන අතිකාල පැය ගණන 100 ඉක්මවන අවස්ථාවලදී ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

## 8. ආපදා රාජකාරි කටයුතු වල නිරත නිලධාරීන් සඳහා දිමනා ලබාදීම.

### 8.1. තක්සේරු කමිටු නිළධාරීන් හා හානි තක්සේරු අයදුම්පත් යොමු කිරීම සඳහා සම්බන්ධ වන නිළධාරීන් සඳහා දීමනා ලබාදීම.

දේපල හානි තක්සේරු කර ප්‍රතිලාභීන් වෙත වන්දි ලබාදීමේ කටයුතු කඩිනමින් හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා අංක අමප 005/715/047/18/ හා 2018.06.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් 2017 වර්ෂයේ සිට හදිසි ආපදාවන්ගෙන් හානියටපත් දේපළ තක්සේරු කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පත් කර ඇති තක්සේරු කමිටුවේ උපරිම නිලධාරීන් තිදෙනෙකුට රු.100/- බැගින් සහ තක්සේරු කමිටුවේ සමාජිකයන් නොවන එහෙත්, හානි තක්සේරු කිරීමේ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධවන දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් සියළු දෙනා අතර අනුපාතිකව බෙදී යන පරිදි එක් ආකෘති පත්‍රයකට අදාලව තක්සේරු කිරීමේ මුළු ක්‍රියාවලියම සඳහා රු.100/-ක දීමනාවක්ද බැගින් දේපළ හානි තක්සේරු කර අයදුම්පත් යොමු කිරීම වෙනුවෙන් එක් හානි තක්සේරු අයදුම්පත්‍රයක් සඳහා රු.400/-ක දීමනාවක් එම නිලධාරීන්ට ගෙවීමට අනුමැතිය ලැබී ඇත.

මෙම දීමනාව ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලීම් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් තම නිර්දේශය සහිත ජා.ආ.ස.සේ.ම.31 ආකෘතිය මගින් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගෙන් අනුමැතිය ලබාගැනීම සඳහා යොමු කළ යුතු අතර එහිදී පහත කරුණු අනිවාර්යයයෙන් සපුරා තිබිය යුතුය.

- හානි තක්සේරු කටයුතු සිදුකරන ලද අයදුම්පත් වලට අදාළව සියලුම ප්‍රතිලාභීන් වෙත වන්දි මුදල් ගෙවා අවසන් කර තිබීම.
- අදාළ සියලුම හානි තක්සේරු අයදුම්පත්‍රවල තොරතුරු මාර්ග ගත තොරතුරු පද්ධතියට ඇතුලත් කර තිබීම .

**8.2 . ආපදා අවස්ථාවන්හිදී රාජකාරී කටයුතුවල නියුතු වූ රජයේ නිලධාරීන් සඳහා දීමනා ගෙවීම**

ආපදා අවස්ථාවන්හිදී රාජකාරී කටයුතුවල නියුතු වූ රජයේ නිලධාරීන් සඳහා දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද අමප/17/1422/715/023 හා 2017.09.26 දිනැති සහ අංක අමප/19/1411/120/021 හා 2019.07.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව 2019.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි විස්තීරණ ආපදා අවස්ථාවන්හිදී එම රාජකාරීවල නියුතු වූ නිලධාරීන් හට දීමනා ලබාදීම සම්බන්ධයෙන් ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් අංක NDRSC/2019/01 හා 2019.09.11 දිනැති චක්‍රලේඛය මඟින් නිකුත් කර ඇති උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

එහිදී මෙම දීමනා ගෙවීම් කරනු ලබන්නේ කුමන ආපදා අවස්ථාවක් සඳහා ද, ගෙවීම් කරනු ලබන්නේ කා සඳහා ද, ගෙවීම් කරනු ලබන උපරිම දින සංඛ්‍යාව හා මෙම දීමනා හිමිවන ආපදා පැවති ප්‍රදේශ පිළිබඳව ආපදා කළමනාකරණ විෂය භාර අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කර දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත දැනුම් දීමෙන් අනතුරුව ජා.ආ.ස.සේ.ම. 32 ආකෘති ප්‍රකාරව තම දිස්ත්‍රික්කයේ නිලධාරීන් වෙත දීමනා ගෙවීම් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ඉල්ලීම් කළ යුතුය.

**මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න**
**ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී**
**ලේකම්**
**ආරක්ෂක අමාත්‍යාංශය**

**පිටපත්:**

1. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.
2. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.